U.S. Embassy Sri Lanka


**මාධ්‍ය දැනුවත් කිරීම**

මහජන සබඳතා අංශය

දුරකථන:  +94 (11) 202-8500

● විද්‍යුත් තැපැල: : Bickelce@state.gov● Web: http://lk.usembassy.gov


**එ.ජ.-ශ්‍රී ලංකා හවුල්කාරීත්වයෙන් සිදුකළ මත්ද්‍රව්‍ය විරෝධී මෙහෙයුමකින් ක්‍රිස්ටල් මෙතැම්ෆෙටමින් කි.ග්‍රෑ. 463ක් අත් අඩංගුවට**

**කොළඹ, 2026 සැප්තැම්බර් 2 -** එක්සත් ජනපද මත්ද්‍රව්‍ය නියාමන හා බලාත්මක කිරීමේ පරිපාලනයේ (DEA) නවදිල්ලි කාර්යාලය සහ ශ්‍රී ලංකා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය (PNB) එක්ව, ශ්‍රී ලංකාව හරහා ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ක්‍රිස්ටල් මෙතැම්ෆෙටමින් ජාවාරම් කිරීමට උත්සාහ කළ පකිස්ථානය පදනම් කරගත් මත්ද්‍රව්‍ය ජාවාරම් ජාලයක් බිඳ දැමීමේ සාර්ථක ඒකාබද්ධ මෙහෙයුමක් ක්‍රියාත්මක කළේය.

අගෝස්තු 14 සිට 29 දක්වා කාලය තුළ පකිස්ථානයේ සිට කොළඹ දක්වා ගමන් කළ සැකසහිත මුහුදු බහාලුම් පිළිබඳව DEA හි විදේශීය සහයෝගී ආයතන ඒකකය සහ පකිස්ථාන මත්ද්‍රව්‍ය නාශක බලකායේ විශේෂ විමර්ශන අංශය විසින් එකතු කරන ලද කළ බුද්ධි තොරතුරු මත ක්‍රියා කළ ශ්‍රී ලංකා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය, තුවා තුළ සඟවා තිබූ ඇමෙරිකානු ඩොලර් මිලියන 21ක් වටිනා ක්‍රිස්ටල් මෙතැම්ෆෙටමින් කිලෝග්‍රෑම් 463ක් පමණ අත්අඩංගුවට ගත් අතර පකිස්ථාන ජාතිකයන් ඇතුළු සැකකරුවන් කිහිප දෙනෙකු ද අත්අඩංගුවට ගත්තේය.

මෙම මෙහෙයුම මගින් ත්‍රස්තවාදයට මුදල් සපයන සහ අප දෙරටේම ජනතාවට තර්ජනයක් වන ජාත්‍යන්තර අපරාධ සංවිධාන බිඳ දැමීමේදී එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර පවතින ශක්තිමත් හවුල්කාරිත්වය අවධාරණය කරයි.

මෙම සහයෝගීතාව, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය සහ නීතිය බලාත්මක කිරීමේ කටයුතු පිළිබඳ කාර්යාංශය (INL) මගින් ශ්‍රී ලංකා පොලීසියට සහ රේගුවට දිගුකාලීනව ලබාදී ඇති පුහුණුව සහ තාක්ෂණික සහාය මත තවදුරටත් ගොඩනැගී ඇත. ජාත්‍යන්තර අපරාධ සංවිධානවලට එරෙහිව දැඩිව ක්‍රියා කිරීම, නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරමෙන් ඔවුන් ලබන ආදායම අහිමි කිරීම සහ මත්ද්‍රව්‍ය ජාවාරමේ අවදානම්වලින් අපගේ පුරවැසියන් ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජනපදය ශ්‍රී ලංකාව සහ කලාපීය හවුල්කරුවන් සමඟ අඛණ්ඩව කටයුතු කිරීමට කැපවී සිටී.

###